දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543
දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135300/ 2135410/ 2135412 / 2135413
E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk

**චක්‍රලේඛ අංකය: SEC/2026/E/07** **2026 සැප්තැම්බර් 22**

## නිශ්චිතව දක්වනු ලබන කාර්යයන් සඳහා බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සහිත සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම

මෙම චක්‍රලේඛය පහත සඳහන් ආයතනවලට අදාළ වේ.

(i) සියලුම බැංකු සහ මූල්‍ය ආයතන
(ii) සියලුම පළාත් පාලන ආයතන
(iii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
(iv) පළාත් ආදායම් කොමසාරිස්වරු
(v) ප්‍රාදේශීය ලේකම්වරු
(vi) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
(vii) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
(viii) ණය කාඩ්පත් නිකුත් කරන ආයතන
(ix) අනෙකුත් අදාළ රජයේ ආයතන

**1. මාතෘකාව: 2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 103 වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාරව බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සහිත සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම**

2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් හඳුන්වා දෙන ලද විධිවිධානවලට අනුකූලව දේශීය ආදායම් පනතේ 102(3) වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති සෑම තැනැත්තෙකුම 2026 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නිශ්චිතව දක්වා ඇති කාර්යයන් සිදු කිරීමේ දී වලංගු TIN සහතිකයක් ඉදිරිපත් කළ යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වන මා විසින් අදාළ සියලුම රජයේ ආයතන, නියාමන අධිකාරීන්, සහ මූල්‍ය ආයතන වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම එක් එක් කාර්යය සඳහා වගකිව යුතු අදාළ නිලධාරීන් එම සේවාව සැපයීමට පෙර මෙම අවශ්‍යතාව කෙරෙහි අයැදුම්කරු විසින් දක්වා ඇති අනුකූලතාව තහවුරු කර ගත යුතු ය.

## 2. TIN සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වන කාර්යයන්

| අදාළ සේවාව (කාර්යය) | TIN අංකය සත්‍යාපනය කිරීම සඳහා වගකිව යුතු නිලධාරියා |
|---|---|
| යම් *මූල්‍ය ආයතනයක යම් *ගිණුමක් විවෘත කිරීම | මූල්‍ය ආයතනයේ කළමනාකරු |
| ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගැනීම | පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා, බලාත්මක කිරීමේ අධ්‍යක්ෂවරයා හෝ කොමසාරිස්වරයා |
| මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා |
| මෝටර් වාහන බලපත්‍රය අලුත් කිරීම | පළාත් ආදායම් කොමසාරිස්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා |
| ඉඩමක් හෝ ඉඩමක හිමිකමක් ලියාපදිංචි කිරීම | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා |
| ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම | ප්‍රාදේශීය ලේකම්වරයා |
| පැවරුම්ලාභීන් සහ පැවරුම්කරුවන් විසින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක කොටස් පැවරීම | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා |
| ණය කාඩ්පතක් ලබා ගැනීම | බැංකුවේ හෝ ණය කාඩ්පත් නිකුත් කරන අස්ථිත්වයේ කළමනාකරු |

***ගිණුම** යන පදයට යම් මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන යම් ඉතිරි කිරීමේ ගිණුමක්, කාලීන තැන්පතුවක්, ජංගම ගිණුමක් හෝ වෙනත් යම් වර්ගයක තැන්පතු ගිණුමක් ඇතුළත් වේ. බද්ධ ගිණුමක් සම්බන්ධයෙන් වන කල්හි, මෙම කාර්යය සඳහා සියලුම බද්ධ ගිණුම් හිමියන් වෙන් වෙන්ව සලකනු ලැබිය යුතු ය.

***මූල්‍ය ආයතනයක්** යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ දැක්වීම තුළ බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වන අතර එයට බලපත්‍රලාභී විශේෂිත බැංකු මෙන්ම බැංකුවකට සමාන ආකාරයකට නියාමනය වනු ලබන බැංකු නොවන මූල්‍ය ආයතන ද ඇතුළත් වේ.

## 3. අදාළ නිලධාරීන්ගේ වගකීම්

ඉහත නිශ්චිත ලෙස දක්වා ඇති නිලධාරීන්:

(i) අදාළ කාර්යය සිදු කිරීමට පෙර වලංගු **TIN සහතිකය ඉදිරිපත් කරන ලෙසට අයැදුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය;

(ii) TIN සහතිකයේ අව්‍යාජත්වය සත්‍යාපනය කර ගත යුතු ය;

(iii) **පහත සඳහන් කර ඇති පරිදි නිදහස් කිරීමක් අදාළ වන විට** හැර ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලවීමෙන් තොරව මෙම විධිවිධාන යටතේ කිසිදු කාර්යයක් සම්පූර්ණ කිරීම නොකරන බවට වගබලා ගත යුතු ය;

(iv) අධීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය පරිදි සුදුසු අනුකූලතා වාර්තා පවත්වාගෙන යා යුතුය. මේ සම්බන්ධයෙන්, එකතු කරගත් ලේඛනයේ පිටපතක් රඳවා තබා ගත හැකි අතර, නැතහොත් අයැදුම්කරුගේ TIN අංකය අදාළ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අයැදුම්කරුගේ වාර්තාවල සටහන් කළ හැකිය.

****TIN සහතිකය**

**(අ)** ලියාපදිංචි වීමෙන් අනතුරුව අදාළ තැනැත්තා වෙත **බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක්** ලබා දෙමින් දේශීය ආදායම් කොමසාරිස් විසින් TIN සහතිකයක් නිකුත් කරනු ලැබේ. 2023.05.31 දිනැති අංක 2334/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව, 2023 දෙසැම්බර් 31 වන දිනට වයස අවුරුදු 18ක් වන හෝ 18ට වැඩි සියලුම වාසික පුද්ගලයින් මෙන්ම 2024 ජනවාරි 01 වන දින හෝ එදිනට පසු වයස අවුරුදු 18ට එළඹෙන වාසික පුද්ගලයින් (එම වයසට එළඹීමෙන් අනතුරුව) බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීම අනිවාර්ය වේ. මෙම කාර්යය සඳහා අදාළ ටින් (TIN) සහතිකයේ ඡායා පිටපතක් අයැදුම්කරු විසින් ඉදිරිපත් කළ හැකිය.

**(ආ)** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඊ - සේවාව හරහා තමන්ගේ TIN අංකය තහවුරු කර ගැනීම සඳහා පුද්ගලයින්හට අවස්ථාව සලසා ඇති අතර TIN අංකය තිරයේ දිස් වේ. අදාළ පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් (NIC) අංකය සහ TIN අංකය පැහැදිලිව දැක්වෙන එම තිරයේ මුද්‍රිත පිටපතක් ඉහත කාර්යයන් සඳහා නිල TIN සහතිකය වෙනුවට පිළිගනු ලැබිය හැකි ය.

**(ඇ)** මෙම කාර්යය සඳහා නිලධාරීන්ට ඉහත සහතික වල මෘදු පිටපත් ද පිළිගනු ලැබිය හැකි ය.

TIN සහතිකයේ ආදර්ශයක් සහ ඉහත සඳහන් ආකාරයට ගනු ලැබූ තිරයේ මුද්‍රිත පිටපතක ආකෘතියක් ඇමුණුම 1හි දක්වා ඇත.

**TIN සහතිකය ඉදිරිපත් කිරීමෙන් නිදහස් කිරීම්**

TIN සහතිකයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව:

(i) අදාළ කාර්යය සිදු කරනු ලබන දිනට වයස අවුරුදු දහඅට (18)ට එළඹ නොමැති පුද්ගලයෙකුට;

(ii) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා නිර්වාසික පුද්ගලයෙකුට;

මෙම නිදහස් කිරීමේ දී, අදාළ කාර්යය සිදු වන දිනය වන විට ශ්‍රී ලංකාවට පැමිණ දින එකසිය අසූ තුනකට වඩා අඩු දින ගණනක් ශ්‍රී ලංකාවේ ගත කර ඇති ශ්‍රී

ලංකාවේ පුරවැසියකු නොවන පුද්ගලයෙකු නිර්වාසික පුද්ගලයෙකු ලෙස සලකනු ලැබිය හැකි ය.

මෙම නිදහස් කිරීම සඳහා නිර්වාසික පුද්ගලයෙකු ලෙස ප්‍රකාශ කරනු ලබන වෙනත් යම් පුද්ගලයෙකු සිය වාසිකභාවය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තහවුරු කිරීමක් ඉදිරිපත් කළ යුතු ය. එවැනි තහවුරු කිරීමක් itp@ird.gov.lk (mailto:itp@ird.gov.lk) වෙත ඉල්ලීමක් භාර දීම මගින් ලබා ගත හැකි ය.

(iii) ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද යම් පුද්ගලයෙකුට;

මෙම නිදහස් කිරීම සඳහා හිමිකම් පෑම පිණිස අදාළ පුද්ගලයා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රතික්ෂේප කිරීමේ ලිපියක් ලබා ගත යුතු ය.

(iv) තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් යටතේ වරප්‍රසාද හිමි පුද්ගලයෙකුට හෝ සංවිධානයකට;

(v) තනි පුද්ගලයෙකු හැර යම් අස්ථිත්වයකට (සමාගමක්, හවුල් ව්‍යාපාරයක්, රාජ්‍ය ආයතන, සමිති, අරමුදල්, භාර, ඒකක භාර, රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් ආයතන);

අදාළ නොවිය යුතු ය.

## 4. ක්‍රියාත්මක වන දිනය

**මෙම ක්‍රියාපටිපාටිය 2026 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.** ඒ අනුව මෙහි සඳහන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට සම්පූර්ණයෙන් අනුකූල වන ලෙස කටයුතු සිදුවීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය වන පරිපාලන, මෙහෙයුම් සහ පද්ධති පිළියෙල කිරීම් සිදු කරන මෙන් අදාළ සියලුම ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

රුක්දේවී පී. එච්. ප්‍රනාන්දු
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. භාණ්ඩාගාර ලේකම් – මුදල් අමාත්‍යාංශය
2. විගණකාධිපති – විගණකාධිපති දෙපාර්තමේන්තුව
3. අධිපති – ශ්‍රී ලංකා මහ බැංකුව

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# INLAND REVENUE DEPARTMENT

## බදු ගෙවන්නා හඳුනාගැනීමේ සහතිකය
## வரி செலுத்துநர் அடையாளச் சான்றிதழ்
## Taxpayer Identification Certificate

නිකුත් කළ දිනය
வழங்கப்பட்ட திகதி
Date of issue

Date

Name and Address

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය
வரி செலுத்துநர் அடையாள இலக்கம்
TAXPAYER IDENTIFICATION NUMBER

TIN in 9 Digits

ඔබට වෙන් කර ඇති බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය ඉහත සඳහන් පරිදි බව මෙයින් සහතික කරමි.

உங்களுக்கு ஒதுக்கீடு செய்யப்பட்ட வரி செலுத்துநர் அடையாள இலக்கம் மேலே குறிப்பிடப்பட்டதாகும் என நான் சான்றுப்படுத்துகின்றேன்.

I certify that the Taxpayer Identification Number assigned to you is as given above

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

உள்நாட்டு இறைவரி ஆணையாளர் நாயகம்
உள்நாட்டு இறைவரித் திணைக்களம்

Commissioner General of Inland Revenue
Inland Revenue Department

https://www.ird.gov.lk Page 1 of 1

TIN අංකය තහවුරු කිරීමේ තිරයේ මුද්‍රිත පිටපත

8/19/26, 2:45 PM Search Certificate - RAMIS

(/)

**Verify IRD Information**

Entity search

| | | | |
|---|---|---|---|
| Entity ID type | NIC | Entity ID | NIC |
| Email ID | | | |
| Mobile No | [redacted] | Send OTP | |
| * Enter OTP | [redacted] | | |

The e-service facility is mainly compatible with Google Chrome and Microsoft Edge browsers. Kindly use the latest version of Google Chrome or Microsoft Edge browser.

Search Clear Go to Main Menu

Information

**You are already registered with the Inland Revenue Department. Your Taxpayer Identification Number (TIN) is**

**TIN in 9 Digits**

**If you have not received the Taxpayer Registration Certificate, you may visit the IRD Head Office or the Nearest Metro/Regional Office to obtain the Taxpayer Registration Certificate**

**For further details, call our hotline 1944**

Department of Inland Revenue, Sri Lanka,
Chittampalam A. Gardiner Mawatha, Colombo 02.
© 2014, All rights reserved by Inland Revenue Department - Sri Lanka

[redacted]